**බදුල්ල චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2017**

-----------------------------------------------------------------------------

බදුල්ල චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල (ඕඑෆ්අයිඩී) සහ සවුදි සංවර්ධන අරමුදල (එස්එෆ්ඩී) අතර 2015 ජූනි 26 දින එළඹි අංක 1661 පී සහ 2015 ඔක්තෝබර් 30 දින එළඹි අංක 10/639 දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

-----------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහා මාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, පේරාදෙණිය බදුල්ල චෙන්කලාඩි මාර්ගයේ බදුල්ල සිට චෙන්කලාඩි දක්වා කි.මී.147 ක මාර්ග කොටස පුනරුත්ථාපනය කිරීම මඟින් මධ්‍යම හා ඌව පළාත් සමඟ නැගෙනහිර පළාතේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම හා ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සහ එම පළාත්වල ආර්ථික කටයුතු ඉහළ නැංවීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,200 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 140 ක් සහ එයින් රු.මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො.මිලියන 60 ක් ඔපෙක් අරමුදල සඳහා වූ ජාත්‍යන්තර අරමුදල සහ රු.මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො.මිලියන 60 ක් සවුදි සංවර්ධන අරමුදල ඒකාබද්ධව මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි එ.ජ.ඩො. මිලියන 20 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2019 මාර්තු වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

**(ආ)** ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

**(ඇ)** ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්,මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

**(ඈ)** ණය යටතේ අපසු ගැනීම්, ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

**(ඉ)** ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

**(ඊ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

**(උ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

**(ඌ)** ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවූයේද යන බව.

## 2.2 මූල්‍ය ප්‍රකාශන

-----------------

## 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

**(අ)** 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රධාන වියදම් ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පත් කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

**(ඈ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව

**(ඉ)** ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුල රු.869,260 ක් ලෙස පෙන්වා ඇති මුදල මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ඉතිරි මුදල ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. මිලියන 1.20 ට අදාල ශේෂය සමඟ එකඟ නොවීය.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත පරිදි දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද ප්‍රතිපාදන | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | **2017** දෙසැම්බර් **31** දිනට |
|---|---|---|---|---|---|
| | **එ.ජ.ඩො. මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| ඔපෙක් අරමුදල සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 60 | 7,800 | 1,715 | 1,685 | 1,685 |
| සවුදි සංවර්ධන අරමුදල | 60 | 7,800 | - | - | - |
| ශ්‍රී ලංකා රජය | 20 | 2,600 | 400 | 400 | 1,168 |
| එකතුව | 140 | 18,200 | 2,115 | 2,085 | 2,853 |

ව්‍යාපෘතියේ කාල සීමාව තුල ඉලක්ක සපුරාගැනීම සඳහා ව්‍යාපෘතියේ මුළු කාලසීමාව ආවරණය වන පරිදි මාසික, කාර්තුමය, ද්විවාර්ෂික ආදි වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක ඉස්මතු කරන සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය.

## 3.2 භෞතික ප්‍රගතිය

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** රු.මිලියන 10,500 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ කොන්ත්‍රාත් පැකේජ 03 ක් සහිත බදුල්ල සිට බිබිල දක්වා වූ පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ කිලෝමීටර් 60 ක මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු 2017 ජනවාරි මාසයේ ආරම්භ කර තිබුණි. කොන්ත්‍රාත්තු යටතේ පුනරුත්ථාපන කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට මාර්ගයේ අදාල කොටසේ පුනරුත්ථාපන කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 1.8 සිට සියයට 7.8 දක්වා පරාසයක මන්දගාමී වී තිබුණි.

**(ආ)** ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් සහ ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය සමඟ ගිවිසුම් වලට එළඹීමකින් තොරව උපයෝගිතා මාරු කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 526 ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, 2017 දෙසැම්බර් 31 දිනට විදුලි කණු සහ දුරකථන මාර්ග මාරුකිරීම පිළිවෙලින් සියයට 24 සහ සියයට 16 ලෙස මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර ජල සැපයුම් හා ජල ප්‍රවාහන මාර්ග මාරු කිරීමේ කිසිඳු ප්‍රගතියක් වාර්තාවී නොතිබුණි.

## 3.3 මතභේදාත්මක ස්වභාවයේ කරුණු

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ලැබුණු තොරතුරු වලට අනුව සියළුම කොන්ත්‍රාත් පැකේජ සඳහා 2017 වර්ෂය තුල බලමුළු ගැන්වීමේ වැඩපූර්ව අත්තිකාරම් වශයෙන් රු.මිලියන 1,488.70 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා ඇත. කෙසේවෙතත්, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4 (1) ඡේදයට පටහැනිව, එහිදී තාවකාලික මුදල් අයිතම සහ අවිනිශ්චිතතාවයන් ඇතුළු අත්තිකාරම් ගණනය කිරීමේදී යතුරුලියන දෝෂයක් හේතුවෙන් රු.මිලියන 456.80 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි.

**(ආ)** බදුල්ල සිට බිබිල දක්වා වූ මාර්ගයේ ගස් 6,487 ක් ඉවත් කිරීමට කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹීමට ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබුණු අතර ඒ සඳහා රු.මිලියන 8.10 ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ඉවත් කරන ලද දැව කඳන් 2,174 ක දැව සංස්ථාවට භාරදීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**(ඇ)** රක්ෂණ ඔප්පු ලබාගැනීම සඳහා ප්‍රමාණ බිල්පතේ දක්වා තිබූ රු.මිලියන 21 ක මුදලක් එකවර ගෙවීමක් ලෙස කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණද ඒ සඳහා අදාල කොන්ත්‍රාත්කරුවන් විසින් වැය කර ඇත්තේ රු.මිලියන 4.80 ක මුදලක් පමණක් බව ඔප්පු විය.

**(ඈ)** ව්‍යාපෘති තත්ත්ව සහතික කිරීමේ සැලැස්මට අනුව කොන්ත්‍රාත්කරු විසින් සකස් කරන ලද පාරිසරික සුරක්ෂිතතා සැලැස්ම සඳහා 2018 මැයි 31 දින වන විටත් උපදේශකයින්ගේ අනුමැතිය ලැබී නොතිබුණි.

## 3.4 ඉඩම් අත්පත් කරගැනීමේ ගැටළු

-------------------------------------

මාර්ග ඉදිකිරීමේ කටයුතු සඳහා 2017 දෙසැම්බර් 31 දක්වා ඉඩම් කැබලි 5,411 ක් අත්පත් කරගැනීමට ව්‍යාපෘතිය ඉලක්ක කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් කැබලි 40 ක් අත්පත් කරගැනීම සඳහා රු.මිලියන 13.30 ක වන්දි ගෙවා තිබුණි. තවද, ඉඩම් කැබලි 38 ක් සඳහා හිමිකම් පියවීම ප්‍රමාදවීම හේතුවෙන් පොළී වශයෙන් රු.මිලියන 3.80 ක් ගෙවා තිබුණි.